## <u>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආර්ථික දුෂ්කරතාවලින් පෙළෙන සිසුන් සඳහා යෝජිත ශිෂ්‍යත්ව අරමුදල.</u>

1. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතුවල නිරතවන අතිශය ආර්ථික දුෂ්කරතා සහිත සිසුන් සඳහා ශිෂ්‍යත්ව අරමුදලක් පිහිටුවීමට විශ්වවිද්‍යාලය තීරණය කොට ඇත. අදාල ශිෂ්‍යත්ව පහත පරිදි වේ.

2. i. එක් අධ්‍යයන වර්ෂයක් සඳහා මාසික ව රු.2500/- බැගින් වාරික 10ක් වන පරිදි එක් ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක සඳහා වන " මාසික ශිෂ්‍යත්වය ".

   ii. හදිසි අවශ්‍යතාවක දී එකවර රු. 25000/- ක් විශ්වවිද්‍යාලය ජීවිතයේ එක්වරක් පමණක් ලබාගත හැකි "හදිසි අවස්ථා මුදල් ප්‍රදානය " .

3. ඉහත අරමුදල සඳහා දායකවීමට ඔබ කැමැති නම් ඒ පිළිබඳව ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ශිෂ්‍ය සුභසාධක සමඟ සාකච්ඡා කර අදාළ මුදල්, ගිණුම් අංක 097100182315472 වෙත හෝ මූල්‍යාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත චෙක්පතක් මගින් ලබාදිය හැක.

4. ඔබ විසින් ලබාදෙන මුදල් පහත ආකාරයෙන් තැන්පත් කළ හැක.
   i. ඉහත සඳහන් කළ ශිෂ්‍යත්වයක් සඳහා එකවර රු.25,000/- ක මුදලක් තැන්පත් කිරීම.
   ii. අරමුදල් වැඩි දියුණු කර ගැනීම සඳහා කෙනෙකු සතු නිශ්චල දේපලක් අරමුදලට ලබාදීම/බුදලයක් පරිත්‍යාග කිරීම.
   iii. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ශිෂ්‍ය සුභසාධක හරහා එක් ශිෂ්‍යාවක හෝ ශිෂ්‍යයකු තෝරාගෙන ඔහු හෝ ඇය අධ්‍යයනය කරනු ලබන වසර 3 හෝ 4 කාලසීමාව සඳහා මුදල් තැන්පත් කිරීම.

5. අරමුදලට දායකවීම මගින් ඔබ විසින් සිදුකරනු ලබන ජාතික සහ සමාජීය මෙහෙවර අතිශය අගයන අතර ඒ තුළින් ආර්ථික දුෂ්කරතාවෙන් පෙළෙන දරුවන්ගේ අනාගත අධ්‍යයන අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමෙහි ලා ඔබ ලබාදෙන පිටිවහල විශ්වවිද්‍යාලයේ ගෞරවයට පාත්‍ර වේ.

6. මේ පිළිබඳ වැඩිදුර විස්තර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ශිෂ්‍ය සුභසාධක (දු.අංක. 0112803471) මගින් ලබා ගත හැක.

ලේඛකාධිකාරී
2016.02.23

**Proposed scholarship scheme for financially underprivileged students of Sri Jayewardenepura University**

1) It has been decided to establish a scholarship fund to grant scholarships to needy undergraduates enabling them to carry on their studies without financial difficulties.

2) (i) Monthly scholarship of ten installments of Rs.2,500/- each, per year.
   (ii) An instant, scholarship of Rs.25,000/- offered in an emergency, once in the entire undergraduate career.

3) As a worthy citizen who wish the betterment of the nation, please contribute to redress the grievances of the budding intellectuals wiping away the barricades caused by financial difficulties and creating a feeling among them that the citizens are ready to donate their own wealth to see the success of the University students.

4) Your donations could be made in either of the following methods.
   (i) A sum of Rs.25,000/- deposited at once for one of the above mentioned scholarships.
   (ii) A property donated to the fund.
   (iii) Deposit an amount for the active period of study ( 3 years or 4 years ) for a student selected through SAR/SW

5) Your contribution will help the students with financial difficulties to continue their University education. It is undoubtedly both a national and a social service, which will be deeply appreciated by the University.

6) For further information Please contact the Senior Assistant Registrar / Student Welfare Division. (Tel : 011 – 2803471)

Registrar

23.02.2016

**<u>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමඟ යම් පුද්ගලයෙක්/කුටුම්බයක්/ සමාගමක්/භාරකාරත්වයක්/ආයතනයක්/සංගමයක්/අරමුදලක් විසින් ශිෂ්‍යත්ව/ශිෂ්‍යාධාර/අරමුදල්/භාරකාරත්ව/ප්‍රදානයක් ආරම්භ කිරීමේ දී තොරතුරු ලබාගැනීම.</u>**

**01.** අරමුදලේ නාමය : මෙය.........................................................ශිෂ්‍යත්වය/ ශිෂ්‍යාධාරය/අරමුදල/භාරකාරත්වය යනුවෙන් හැඳින්වේ.

02. අරමුදලේ පරිත්‍යාගය: පරිත්‍යාගය සඳහා මුදල ප්‍රේරණය කරනු ලබන්නේ ........................................................................... නැමැති පූජ්‍ය/පූජක/මහතා/මහත්මිය/මෙනවිය/සමාගම/ ආයතනය/සංගමය/භාරකාරත්වය/අරමුදල විසිනි.

03. අරමුදලේ ස්වභාවය: පරිත්‍යාගශීලී මහතා/මහත්මියගේ කැමැත්ත මත පහත අංක. **i** හෝ **ii** තෝරා ගත හැකිය.)

i. එක් අධ්‍යයන වර්ෂයක් සඳහා මාසික ව රු.2500/- බැගින් වාරික 10ක් වන පරිදි එක් ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක සඳහා වන " මාසික ශිෂ්‍යත්වය ".

ii. හදිසි අවශ්‍යතාවක දී එකවර රු. 25000/- ක් විශ්වවිද්‍යාලය ජීවිතයේ එක්වරක් පමණක් ලබාගත හැකි "හදිසි අවස්ථා මුදල් ප්‍රදානය " .

04. අරමුදලේ ප්‍රමාණය: මෙම පරිත්‍යාගය මුදලින්............................. /චෙක්පතින් ..............................(චෙක්පත්අංක:........ ...............) තැන්පත් කරනු ලැබේ.

05. විශ්වවිද්‍යාලයේ එක් ශිෂ්‍යාවක හෝ ශිෂ්‍යයකු තෝරා ශිෂ්‍යාධාර පරිත්‍යාග කිරීම.

ආධාරලාභියා අරමුදල් පරිත්‍යාගකරුගේ අවශ්‍යතාව හා අරමුදලේ නිමිත්ත මත තෝරාගැනීම ආධාරලාභියා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍යයෙක්/ශිෂ්‍යාවක් වශයෙන් ලියාපදිංචිව සිටිමින් උසස් අධ්‍යාපනය ලබන්නෙකු විය යුතු අතර කුමන ක්ෂේත්‍රයක ඉගෙනුම ලබන අයෙකු ද යන්න තීරණය කළ හැකිය.

<u>ශිෂ්‍යත්වලාභියාගේ තොරතුරු</u>

නම: ………………………………………………………………………………

ලියාපදිංචි අංකය:………………………………………………………………

ලිපිනය :………………………………………………………………………………

………………………………………………………………………………

පීඨය: ………………………………………………………………………………

අධ්‍යයන වර්ෂය:…………………………………………………………………

06. ශිෂ්‍යාධාර ලාභියා විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු අසත්‍ය බව සනාථ වූ අවස්ථාවක එම ශිෂ්‍යත්වය අහෝසි කිරීම, ඕනෑම විටෙක ද සාධාරණ හේතුවකින් තොරව ශිෂ්‍යයා/ශිෂ්‍යයාව අධ්‍යයන කාර්යයන්හි සප්‍රමානික සහභාගීත්වයක් නොදක්වන්නේ නම් ඒ අවස්ථාවේ ද, විනය විරෝධී ක්‍රියාවක් හේතුකොට ගෙන දඬුවම් ලැබූ අවස්ථාවක ද අදාළ අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශ ප්‍රධානගේ නිර්දේශය ඇතිව උක්ත ශිෂ්‍යාධාරය අහෝසි කළ හැකිය. එසේම එවැනි කරුණක් සනාථ වූ ඕනෑම අවස්ථාවක මෙම ශිෂ්‍යාධාරය අහෝසි කිරීමේ බලය මා/අප ආයතනය සතුය. එසේම මම/අප ආයතනය විසින් බලය පවරනු ලබන නියෝජිතයකුගෙන් ලබාගන්නා ලද පූර්ව පූර්ණ ලිඛිත අවසරයකින් තොරව මෙම මුදල අහෝසි හෝ අන්සතු කළ නොහැක.

ඉහත කොන්දේසි අනුව මෙම අරමුදල ලබාදීමට මාගේ/අප ආයතනයේ කැමැත්ත මෙමඟින් ප්‍රකාශ කර සිටිමි/සිටිමු.

ශිෂ්‍යාධාරය පරිත්‍යාග කරන්නාගේ නම: ……………………………………………………

ලිපිනය: ………………………………………………………………………………

දුරකථන අංකය: …………………………………………………………

තනතුර: ………………………………………………………………………

අත්සන: ………………………………………………………………………

ආයතනයේ නම:…………………………………………………………………

දිනය: ………………………………………………………………………